IHRA

UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2018/2019

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2021 අගෝස්තු)**

## BLE 307 - අලෙවි කළමනාකරණය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

**(01)** සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

**(02)** මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතරකින් (04) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියළුම පිටු අනුපිළිවෙල අනුව අංකනය කරන්න.

01.

I. වර්තමාන අර්බුධකාරී පරිසරය තුල කොවිඩ් 19 අභියෝගය හමුවේ අලෙවිකරුගේ භූමිකාව සුදුසු උදාහරණ සපයමින් විස්තර කරන්න.

(ලකුණු 10)

II. කොවිඩ් 19 අභියෝගය හමුවේ පාරිභෝගික අපේක්ෂාවන්හි සිදු වූ වෙනස්කම් උදාහරණ සපයමින් විස්තර කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 25)

02.

I. භාණ්ඩයක ජීවන චක්‍රයක විවිධ අදියරයන් ගේ විශේෂ ලක්ෂණයන් හා ඒ ඒ අදියරයන්හිදී ගත හැකි යෝජනා ඉදිරිපත් කරමින් විස්තර කරන්න.

(ලකුණු 10)

II. පාරිභෝගිකයාගේ මිලදී ගැනීමේ තීරණ ක්‍රියාවලිය සුදුසු උදාහරණයක් සපයමින් විස්තර කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 25)

03. කොවිඩ් 19 තත්ත්වය යටතේ බාහිර අලෙවිකරණ පරිසරයේ ඇතිවූ ව්‍යාපාරික අවස්ථාවක් මත හෝ ආයතන අභ්‍යන්තර මූලාශ්‍රයන්ගෙන් ලද අදහසක් අනුව, නව භාණ්ඩයක් වෙළඳපලට ඉදිරිපත් කිරීමට ඔබ ආයතනය තීරණය කළේ යැයි සිතන්න. සුදුසු උදාහරණයක් සමගින් නව නිෂ්පාදන ක්‍රියාවලිය පියවරෙන් පියවර සවිස්තරාත්මකව විස්තර කරන්න.

(මුළු ලකුණු 25)

04.

I. ඔබ තෝරාගන්නා කර්මාන්තයක් සඳහා (සුපිරි වෙළඳසැල් හැර) මයිකල් පෝටර් විසින් හඳුන්වා දෙනු ලැබූ පස් වැදෑරුම් බලවේගයන් විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

II. ඔබ තෝරාගන්නා ලද භාණ්ඩයක් සඳහා යෝජිත වෙළඳපල ඛණ්ඩනයක් සිදුකර එහි ඔබ විසින් තෝරා ගැනීමට යෝජනා කරන ඉලක්ක වෙළඳපල හඳුනාගන්න. ඔබගේ එම තෝරා ගැනීමට හේතු විස්තර කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 25)

***************

04.

I. ඔබ තෝරාගන්නා කර්මාන්තයක් සඳහා (සුපිරි වෙළඳසැල් හැර) මයිකල් පෝටර් විසින් හඳුන්වා දෙනු ලැබූ පස් වැදෑරුම් බලවේගයන් විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

II. ඔබ තෝරාගන්නා ලද භාණ්ඩයක් සඳහා යෝජිත වෙළඳපල ඛණ්ඩනයක් සිදුකර එහි ඔබ විසින් තෝරා ගැනීමට යෝජනා කරන ඉලක්ක වෙළඳපල හඳුනාගන්න. ඔබගේ එම තෝරා ගැනීමට හේතු විස්තර කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 25)

***************

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2018/2019

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2021 අගෝස්තු)

# BLE 308 - ශ්‍රමයේ නූතන ප්‍රවණතා

**අයදුම්කරුවන්ට උපදෙස් :**

**(01)** මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. (අ) කොටසේ සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතු අතර (ආ) කොටසේ ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(02) කාලය පැය තුනයි. (03)

(03) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියළුම පිටු අනුපිළිවෙල අනුව අංකනය කරන්න.

## (අ කොටස)

01. "COVID-19 වසංගතයේ ගෝලීය ව්‍යාප්තිය කාන්තාවන්ට වැඩි සෘනාත්මක බලපෑමක් ඇති කර තිබේ; වැඩි සෞඛ්‍ය අවදානමකට මුහුණ දීම, රැකියා අහිමිවීම, සහ ගෘහස්ථ හිංසනයන්ට මුහුණ දීම මින් ප්‍රධාන වේ."

(I) මෙම සෘනාත්මක බලපෑම ශ්‍රී ලංකා කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වයට සහ කාන්තා විදේශ සේවා නියුක්තිය කෙරෙහි කවර බලපෑමක් එල්ල කරනු ලබයිද? උදාහරණ යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

(II) මෙම සෘනාත්මක බලපෑමට මුහුණ දීම සඳහා වැඩ පරිසරයේ සිදුවිය යුතු වෙනස්කම් කවරේද? උදාහරණ යොදා ගනිමින් පැහැදිලි කරන්න

(ලකුණු 20)

(මුළු ලකුණු 20 X 2=40)

## (ආ කොටස)

02.

(I) සදාචාරාත්මක වටිනාකම් සහ ආචාර ධර්ම යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 03)

(II) "යහපත් ආචාර ධර්ම යහපත් ව්‍යාපාරයක් බිහි කරයි". මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

(III) "නිතිය සදාචාරත්මක හැසිරීම් පාලනය කිරීමෙහිලා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි" සුදුසු රූප සටහන් සහ උදාහරණ යොදාගනිමින් පහදන්න

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

03.

(I) සෘජු බියගැන්වීම සහ වක්‍ර බියගැන්වීම යන්න කෙටියෙන් පහදන්න.

(ලකුණු 03)

(II) ආයතනික වෙනස්කම් කිරීම සඳහා ඉලක්ක වන ප්‍රධාන කණ්ඩායම් කවරේද? ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ප්‍රතිවිපාක කවරේද?

(ලකුණු 04)

(III) "තම ආයතනයේ සිදුවන දූෂණ, අකටයුතුකම් බලධාරීන්ට හෝ මහජනතාවට දැනුම්දීමට ප්‍රථම සේවකයන් විවිධ කරුණු කෙරෙහි තම අවධානය යොමු කරයි". මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

04.

(I) හැඟීම් ජනිත වීම කෙරෙහි බලපාන ප්‍රධාන මූලාශ්‍ර කවරේද?

(ලකුණු 03)

(II) චිත්තවේගීය ශ්‍රමය ඉටුකිරීමේ ප්‍රධාන ආකාර දෙක ලෙස මතුපිට ක්‍රියාකාරිත්වය සහ ගැඹුරු ක්‍රියාකාරිත්වය දැක්විය හැක. මෙම ප්‍රකාශය පහදන්න.

(ලකුණු 04)

(III) "චිත්තවේගීය ශ්‍රමය සේවා අංශයේ සේවකයින්ගෙන් අත්‍යවශ්‍යයෙන්ම අපේක්ෂා කරන හැසිරීමකි". මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

05.

(I) විවිධත්ව කළමනාකරණය යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 03)

(II) විවිධත්ව කළමනාකරණය කිරීමේ අභියෝග කවරේද?

(ලකුණු 04)

(III) විවිධත්ව කළමනාකරණය නොසලකා හැරීමේ ප්‍රතිවිපාක කවරේද? උදාහරණ යොදාගනිමින් පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

06.

(I) රැකියා - ජීවිත සමබරතාවය කෙරෙහි බලපාන සාධක කවරේද? කෙටියෙන් පහදන්න

(ලකුණු 03)

(II) රැකියා - ජීවිත සමබරතාවය ඇතිකිරීමට සහයෝගය ලබා දෙන, ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන නීතිමය විධිවිධාන වල අන්තර්ගතයන් සටහන් කරන්න.

(ලකුණු 04)

(III) "පුද්ගල රැකියා - ජීවිත සමබරතාවය ඇති කිරීම කෙරෙහි ආයතනය සතුවද වගකීමක් ඇත". මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

*****

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2018/2019

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2021 අගෝස්තු)

## BLE 309 - ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති හා සංවර්ධනය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

**(1) ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(6) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

01.

i. කොවිඩ් 19 වසංගතය හමුවේ රටකට තිබිය යුත්තේ කුමන ආකාරයේ විදේශ විනිමය ප්‍රතිපත්තියක්ද?

(ලකුණු 05)

ii. විදේශ විනිමය ඉල්ලුමට හා සැපයුමට බලපාන සාධක කොවිඩ් 19 වසංගතය සමග කුමන ආකාරයට හැසිරේද?

(ලකුණු 05)

iii. පාවෙන විනිමය අනුපාතය පැවතීම කොවිඩ් 19 වසංගතය හමුවේ ශ්‍රී ලංකාවට සිදුවූ බලපෑමක් විග්‍රහ කරන්න.

(ලකුණු 05)

iv. කොවිඩ් 19 වසංගතය හමුවේ සිදුවූ ආර්ථික බලපෑම අවම කිරීම සඳහා විදේශ විනිමය පාලනය ක්‍රියාත්මක කිරීම කෙසේ කළ යුතුද? විග්‍රහ කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02.

i. කොවිඩ් 19 වසංගතය සමඟ රටතුල ආර්ථික කටයුතු සීමා වීම නිසා රටෙහි උද්ධමනය හැසිරීම විස්තර කරන්න.

(ලකුණු 05)

ii. මෙම කොවිඩ් 19 වසංගතය හමුවේ සිදුවූ තත්වයන් නිසා රටතුළ ඇතිවිය හැක්කේ ඉල්ලුමෙන් ඇදුන උද්ධමනයක් ද එසේ නැතිනම් පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයක් ද, එසේ නම් එය විස්තර කරන්න.

(ලකුණු 05)

iii. කොවිඩ් 19 වසංගතය සමඟ ආර්ථික කටයුතු කළමනාකරණයට අනුගමනය කල උද්ධමන පාලන ප්‍රතිපත්ති විස්තර කරන්න.

(ලකුණු 05)

iv. කොවිඩ් 19 වසංගතය සමඟ වූ ආර්ථික පසුබෑමට පිළියමක් ලෙස විදේශ ආයෝජන හා විදේශ ණය කෙතරම් ඉවහල් වේද? විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

03.

i. කොවිඩ් 19 වසංගතයේ ආර්ථික පසුබෑම හමුවේ දිළිඳුබවේ විෂම චක්‍රය හැසිරෙන ආකාරය විග්‍රහ කරන්න.

(ලකුණු 05)

ii. දේශීය ඉතිරිකිරීම් පසුබෑමට ලක් වූ ආර්ථිකය නගා සිටුවීමට කුමන ආකාරයට යොදා ගත හැකිද?

(ලකුණු 05)

iii. කොවිඩ් 19 වසංගතය නිසා වූ ලෝක ආර්ථික පසුබෑම හා ශ්‍රී ලංකා ආර්ථිකයේ අඩපණ වීම ගෙවුම් ශේෂ ලේඛනයට කුමන බලපෑමක් ඇතිකරන්නේ දැයි යන්න පිළිබඳ විග්‍රහ කරන්න.

(ලකුණු 05)

iv. ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ හිගය අවම කරගැනීම සඳහා රජය ගනු ලැබූ ක්‍රියාමාර්ග හා ඒවායේ සාර්ථක/අසාර්ථක භාවය පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

04.

i. කොවිඩ් 19 වසංගතය සමග ආර්ථික කටයුතු කළමනාකරණයට ගනු ලැබූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කවරේද? ඒවා කෙතරම් සාර්ථක වූවාදැයි විස්තර කරන්න.

(ලකුණු 05)

ii. කොවිඩ් 19 වසංගතය හමුවේ ලෝක ගෝලීයකරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු කල බලපෑම පිළිබඳව සවිස්තරාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 05)

iii. ගෝලීයකරණ ප්‍රතිපත්තියේ අපේක්ෂිත වාසිදායී තත්වයන් ශ්‍රී ලංකාවට ලබා ගැනීමට හැකි වූ ආකාරය පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 05)

iv. කොවිඩ් 19 වසංගතය හමුවේ ජාත්‍යන්තර වෙළඳාමට සිදු වූ බාධාකාරී තත්වයන් විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

05.

i. ආතර් ලුවිස් ගේ ද්විත්ව ආර්ථික න්‍යායේ ග්‍රාමීය අංශයේ හා නාගරික අංශයේ ලක්ෂණ මොනවාද?

(ලකුණු 05)

ii. ආතර් ලුවිස් ගේ ද්විත්ව ආර්ථික න්‍යායේ වාසි පිළිබඳව විස්තර කර කොවිඩ් 19 වැනි වසංගත හමුවේ එම වාසි ලබාගත හැකිද?

(ලකුණු 05)

iii. තිරසාර සංවර්ධන ඉලක්ක 17 නම් කරන්න.

(ලකුණු 05)

iv. ශ්‍රී ලංකාවේ වර්තමාන වෙළඳ ප්‍රතිපත්තිය විග්‍රහ කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

06.

i. රටක ආදායම් ව්‍යාප්තිය යන්නෙන් ඔබ හඳුනාගන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. රටක ආදායම් විෂමතාවය මැනීම සඳහා යොදාගන්නා මිනුම් 05 ක් කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 05)

iii. ශ්‍රී ලංකාවේ පසුගිය දශක දෙක තුළ ආදායම් විෂමතාවයේ උපනතිය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. ශ්‍රී ලංකාවේ ආදායම් විෂමතාවය අවම කිරීම සඳහා ගතහැකි ක්‍රියා මාර්ග 05 ක් විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

07.

i. "දිළිඳුකම" පිළිබඳ නිර්වචන 05 ක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 04)

ii. "දිළිඳුකම" මැනීම සඳහා යොදාගත හැකි මිනුම් 05 ක් නම්කොට ඒවා විස්තර කරන්න.

(ලකුණු 04)

iii. මෑත වර්ෂ තුල ශ්‍රී ලංකාවේ දිළිඳුකමේ උපනතියේ ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iv. ශ්‍රී ලංකාවේ දිළිඳුකම නැතිකිරීම සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති 05 ක් තෝරාගෙන ඒවායේ සාධනීය ලක්ෂණ සහ අඩුපාඩු පැහැදිලි කරන්න.

(ලකුණු 04)

v. මෙරට දිළිඳුකම නැතිකිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 05 ක් තෝරාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

08. 2020 වර්ෂයේ ශ්‍රී ලංකා ආර්ථිකයේ හැසිරීම පිළිබඳ පහත මාතෘකා යටතේ රචනයක් ලියන්න.

i. විදේශ අංශයේ හැසිරීම.

(ලකුණු 04)

ii. රාජ්‍ය ණය සහ ණය වාරික ආපසු ගෙවීම.

(ලකුණු 04)

iii. සේවා අංශයේ දායකත්වය.

(ලකුණු 04)

iv. ගෙවුම් ශේෂ ප්‍රශ්නය හා විදේශ විනිමය අර්බුදය.

(ලකුණු 04)

v. රාජ්‍ය අයවැය ලේඛනය හා එහි හිඟය පියවීම.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

***************